## පැතිකඩ



# ජැක්සන්ගේ අබා නැරඹුවෙමි.



**චිත්තරාජ හා කාලදේවගේ හිස ගසා දැමීමේ මොහොත ජේසුස් වහන්සේගේ කුරුසයේ ඇණ ගැසීම සිහිපත් කළේ මන්ද ? හබරාගේ අඹුවගේ ඇඳුම් පැළඳුම් එකලට ගැලපේද ? සුදු දිග රැවුලකින් යුතු පණ්ඩුල බ්‍රහ්මණයා මහ පිරිසක් සමඟ දිව එන දර්ශණය හැරී පොටර් (HARRY POTTER) සිනමා පටය සිහිපත් කළේ කුමක් නිසාද ? 'අබා' සිනමා පටය පුරා විටින් විට රැව් දුන් සංගීත රාවය 'ඛෂධහ ණෂහඨ' සිනමාපටයේ පසුබිම් සංගීතය සිහිපත් කළේ කුමක් නිසාද ? යනාදී රසිකයන් නැගූ ප්‍රශ්ණ රැසකට ජැක්සන් ඉතා ශූර අන්දමින් පිළිතුරු දුන්නේ ඓතිහාසික මූලාශ්‍රවලින් ගත් තොරතුරු පාදක කරගනිමිනි.**

ජැක්සන් ඇන්තනී කලාකරුවාගේ 'අබා' සිනමා පටය මම සිඩ්නි නගරයේදී නැරඹුවෙමි. එය නරඹා ගෙදර ආ විගස මා කළේ මා ළඟ ඇති එකම මහාවංශ පිටපත වන විලියම් ගයිගර්ගේ (WILHELU GEIGER) මහාවංශය පෙරළා බැලීමයි. මා 'මහාවංශය' පෙරළා බැලුවේ සිරිලක ප්‍රාග් ඓතිහාසික අවධිය පිළිබඳ කිසියම් තොරතුරක් සෙවීම සඳහාය.

'අබා' සිනමා පටය නැරඹූ බොහෝ ශ්‍රී ලාංකික සිනමා රසිකයන් තුළ මෙවන් කුතුහලයක් ඇතිවූ බවට සනාථ වන සිදුවීමක් ද සිඩ්නි නගරයේ දී මතුවිය. එනම් 'අබා' දර්ශනයෙන් දින කිහිපයකට පසුව 'අබා' සිනමාපටයේ අධ්‍යක්ෂ ජැක්සන් ඇන්තනියන් සමඟ කතාබස් කරන්නට ලැබුණු අවස්ථාවයි.

'අබා' නැරඹීමෙන් පසුව මෙන්ම මහාවංශය සඳහන් ඇතැම් කරුණු කියවීමෙන් පසුව ද සිරිලක ප්‍රාග් ඓතිහාසික තොරතුරු පිළිබඳව විමසිය යුතුයයි හැගෙන ගැටළු කිහිපයක් මා තුළ ඇතිවිය. ජැක්සන් සමඟ සුහදව කතාබස් කළ සිඩ්නි නුවර රසිකයෝ 'අබා' පිළිබඳව නොයෙකුත් ප්‍රශ්ණ ඔහුගෙන් විමසූහ. ජැක්සන් ඒ සියළුම ප්‍රශ්ණවලට දැඩි ආත්ම විශ්වාසයකින් යුතුව සවිස්තරාත්මකව පිළිතුරු දුන්හ. දීඝගාමිණී කුමරු සිනමාපටය තුළින් මැකී ගියේ කුමක් නිසාද ? චිත්තරාජ හා කාලදේවගේ හිස ගසා දැමීමේ මොහොත ජේසුස් වහන්සේගේ කුරුසයේ ඇණ ගැසීම සිහිපත් කළේ මන්ද ? හබරාගේ අඹුවගේ ඇඳුම් පැළඳුම් එකලට ගැලපේද ? සුදු දිග රැවුලකින් යුතු පණ්ඩුල බ්‍රහ්මණයා මහ පිරිසක් සමඟ දිව එන දර්ශණය හැරී පොටර් (HARRY POTTER) සිනමා පටය සිහිපත් කළේ කුමක් නිසාද ? 'අබා' සිනමා පටය පුරා විටින් විට රැව් දුන් සංගීත රාවය 'LION KING' සිනමාපටයේ පසුබිම් සංගීතය සිහිපත් කළේ කුමක් නිසාද ? යනාදී රසිකයන් නැගූ ප්‍රශ්ණ රැසකට ජැක්සන් ඉතා ශූර අන්දමින් පිළිතුරු දුන්නේ ඓතිහාසික මූලාශ්‍රවලින් ගත් තොරතුරු පාදක කරගනිමිනි.

'අබා' සිනමාපටය ශ්‍රී ලංකාවේ සියළු වාර්තා බිඳ හෙළමින් තවමත් සාර්ථක අන්දමින් ප්‍රදර්ශණය වන්නේ එම සිනමා පටය තුළින් නැගුණු විදග්ධ රසික ප්‍රතිචාරයේ විශමතාවය නිසාය. 'අබා' සිරිලක ඉතිහාසය විකෘති කර ඇතැයි පවසමින් එය තහනම් කළ යුතුයයි හඬ නැගීමත්, සියළුම ශ්‍රී ලාංකිකයන් විසින් නැරඹිය යුතු සිනමා පටයක් ලෙසින් ජනාධිපතිවරයා විසින් හඳුන්වා තිබීමත්, 'අබා' සිනමාපටය නිසා උද්ගත වූ ආන්දෝලනයට පාදක වූ හේතු කිහිපයක් පමණි.

'අබා' තුළින් මතු වුණු මේ 'කලාත්මක ආන්දෝලනය' මා නම් දකින්නේ අපේ රටේ සිනමා ක්ෂේත්‍රයේ ඇතිවූ ඵලදායී ප්‍රවණතාවයක් ලෙසය.

ඕනෑම රටක කලාකරුවන් අතර වාද විවාද මතභේද ඇතිවීම එරට කලා මාධ්‍යකින් ස්වාධීන වර්ධනයට හේතුවයි. 'අබා' සිනමාපටය ශ්‍රී ලංකාවේ ඉතිහාසඥයන් ඇස් අරවන්නක් වී ඇත. 'අබා' නැරඹීමෙන් පසුව විදග්ධ හා සාමාන්‍ය රසිකයන් බොහෝ පිරිසක් අපේ ඉතිහාසය නැවත කියවීමට පෙළඹී ඇති බව ජැක්සන් ඇන්තනි පැවසුවේ මේ නිසාය.

ඉතිහාසය අපක්ෂපාතීව වර්ණනා කර තැබිය යුතු සිදුවීම් මාලාවක් වුවත් පෙරකළ සිට ඉතිහාසය ලියා තැබූ විද්වතුන්ගෙන් එය අපට බලාපොරොත්තු විය නොහැකිය. ඉතිහාසය සටහන් කළ යුගයේදී රජවරුන්ගේ ඕනෑ එපාකම් මත අතමැත්තෙන් වුවද ඉතිහාසය වෙනස් කර ලියූ අවස්ථා ගැන වාර්තා වී ඇත. ප්‍රාග ් ඓතිහාසික යුගයේ පණ්ඩුකාභය කළ සටන ලක්දිව සිංහ හා ශාඛයන් අතර වූ සටනක් ලෙස ඉතිහාස ගතවී ඇත. හෙළදිව මුල් පදිංචිකරුවන් ලෙස සැලකෙන යක්ෂ, නාග, දේව, රාක්ෂ යන ගෝත්‍ර ජනයා එම ඉතිහාස විමර්ශණයට ඇතුළත් වී නැත. මහාවිහාරවාසීන්ගේ අවශ්‍යතාවය මත මහානාම හිමියන් ලක්දිව මුල් පදිංචිකරුවන් නොසලකා හැර ඇතැයි හෙළ හවුල කලක් චෝදනා කළේය. සිංහල බස හා සිංහලකමට උමතුවක් වන තරමට ලක්දිව සිටි මුණිදාස කුමාරතුංගයන් 'චිත්තරාජ' යන උන්මාද චිත්‍රාගේ පියා යයි මතයක් පළ කළේය. කුමාරතුංගයන්ගේ මේ මතය අල්ලා ගත් ඇතැම් විචාරකයන් ඉතිහාස කරුණු වරද්දාගෙන 'අබා' සිනමාපටය නිර්දය ලෙස විවේචනය කළ බව ජැක්සන් ඇන්තනි ප්‍රකාශ කර ඇත.

'අබා' මගින් ලක්දිව ඉතිහාසය විකෘති කළේ යයි හඬ නගමින් එය තහනම් කළ යුතුයයි දඟලන අපේ ඇතැම් විචාරකයන් එක් දෙයක් අමතක වී ඇති බව මගේ වැටහීමය. එනම් 'අබා' යන ඉතිහාසය වාර්තා කරන ඉතිහාස ග්‍රන්ථයතක් නොව ඉතිහාසය පදනම් කරගත් කලාත්මක නිර්මාණයක් බවයි.

කිසියම් නිර්මාණයක යෙදෙන කලාකරුවාට ඓතිහාසික සිදුවීමක් හෝ වෙනත් පුවතක් තෝරාගැනීමට ප්‍රජාතාන්ත්‍රික අයිතියක් ඇත. ඓතිහාසික පුවත් තම නිර්මාණයට පාදක කරගන්නා නිර්මාණකරුවා ඇතැම් සිදුවීම් තෝරාගනියි; ඇතැම් සිදුවීම් ඉවතලයි. තෝරගත් සිදුවීම් පවා තම නිර්මාණයට උචිත ලෙස සකස් කරගනියි. තම නිර්මාණ කුසලතාව අනුව ඇතැම් දේ අළුතෙන් එක් කරයි. ඇතැම් සුළු ඓතිහාසික සිදුවීමක් තෝරාගෙන තම නිර්මාණයට සුදුසු ලෙස එය අවදාරණය කරයි. මේ නිර්මාණාත්මක අභ්‍යාසය ඉතිහාසය වෙනස් කිරීමක් නොවේ. කලාකරුවා සතු කලාත්මක ප්‍රතිභාව හා ස්වාධීනත්වය ගෙනහැර දැක්වීමකි.

ජැක්සන් ඇන්තනිගේ 'අබා' සිනමා නිර්මාණය විචාර බුද්ධියෙන් යුතුව නරඹන සහෘදයෙකු මේ කරුණු වටහා ගනු ඇතැයි මම කල්පනා කරමි.



ආචාර්ය පාලිත ගනේවත්ත





